**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.4.1 (අ) ඡේදය හැර මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලද එකතුව රු. 9,835,526 ක් වූ මුදල් ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට ක්‍රියා කරන බව. | ණය අරමුදල් ලැබීම් ණය ගිණුම මඟින් ගැලපීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ බලපත්‍ර හා කර්මාන්ත බදු මුදල් රු. 1,136,550 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, වර්ෂයට අදාල බිල්කිරීම හඳුනාගෙන උපචිත ප්‍රමාණය ගිණුම්වල දක්වා නොතිබුණි. | සමීක්ෂණය මඟින් හඳුනා ගන්නා ලද සියළුම බලපත්‍ර හා කර්මාන්ත බදු මුදල් අයකරගෙන ඇති බවත්, හිඟ මුදලක් නොමැති බව. | වර්ෂයට අදාල බිල්කිරීම් හඳුනාගෙන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සමඟ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.941,120 ක වෙනසක් පැවතුණි. | වෙනසක් ඇතිව ඇති බවත්, ඉදිරි වර්ෂයේදී ගිණුම් තැබීමේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් උපයෝගී ලේඛන අනුව සැසඳිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 4,500,000 ක් වූ ගිණුම් විෂයයකට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගොඩනැගිල්ලෙන් කොටසක් ඉවත් කළ බවත්, තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට නොහැකි වූ බවත්, සම්පූර්ණ ගොඩනැගිල්ල ඉවත් කළ පසු ගිණුම්ගත වටිනාකම ඉවත් කරන බව. | ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීමේදී දේපල වල ගිණුම්ගත පිරිවැය වටිනාකම ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 553,741 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,698,546 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 1,730,264 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 1946 අංක 30 දරන බදු හා තක්සේරු පනතේ 20 වගන්තිය පරිදි වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කලයුතු වුවත්, ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායමින් කොටසක් අයකරගෙන ඇති බවත්, අමතර සේවකයෙකු ද යොදවා මුදල් අයකිරීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 90,729 ක් වූ හිඟ අක්කර බදු ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මුල් අයිතිකරුවන් සොයා ගැනීමට නොහැකි වී ඇති බවත්, තවදුරටත් සොයාබලා අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු බවට 2020 වර්ෂයේදී හඳුනාගෙන තිබූ ආයතන 122 ක් 2020 ඔක්තෝබර් වනවිටත් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු. 442,600 ක ආදායමක් අහිමි වී තිබූ අතර, එම ව්‍යාපාර මඟින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් ද සිදුව නොතිබුණි. | ඉදිරියේදී බලපත්‍ර ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාමට සෑම උත්සහායක්ම දරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට සභාව සතු ජල ව්‍යාපෘති 05 කට අදාලව පාරිභෝගිකයින් 110 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 1,086,188 ක් වූ හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බිල්පත් නොගෙවන ලද ජල පාරිභෝගිකයින්ගේ ජල සේවා විසංධි කිරිමේ කාර්යය ආරම්භ කර ඇති බවත්, ජල සේවා 44 ක් විසංධි කර ඇති බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,329,887 ක් හා මුද්දර ගාස්තු රු. 3,075,300 ක් අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කරමින් පවතින බවත්, උසාවි දඩ ලබා ගැනීමට ක්‍රියාකර ඇති බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10(6) වගන්තිය අනුව ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රයක කාලසීමාව දීර්ඝ කිරීම උපරිම වසර 02 ක කාලයක් දක්වා දීර්ඝ කරනු ලබන අවස්ථාවක හැර සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය වර්ෂයක් සඳහා පමණක් වලංගු වේ. එසේ වුවද, 2016 වර්ෂයේ සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුල සභාව විසින් අනුමත කල ගොඩනැගිලි සැලසුම් 102 ක් වෙනුවෙන් අනුකූලතා සහතික 14 ක් පමණක් නිකුත් කර තිබුණි. | නව ඉදිකිරීමක් සම්බන්ධයෙන්ම සභාවේ අනුමැතිය ලබාගත යුතු බව මහජනතාව දැනුවත් කල බවත්, ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව. | වසර 02 ඉක්ම වූ අනුමත කළ ගොඩනැගිලි පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ තලගස්කන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම - II අදියර කර්මාන්තයේ කාර්මික නිලධාරී වැඩ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 1.01 පරිදි ක්‍රීඩාපිටිය ඉදිකිරීමට නියමිත භූමියේ මතුපිට පස් අඟල් 06 ක් ඉවත් කර වැඩ බිමෙහි පෙන්වා දෙන ස්ථානයක තැන්පත් කිරීම වෙනුවෙන් වර්ගමීටර් 2288 ක් සඳහා රු. 431,768 ක් 2020 දෙසැම්බර් 29 දින අනුමත සමිතියකට ගෙවා තිබුණි. 2021 මාර්තු 04 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී සංවර්ධනය කළ භූමියේ මතුපිට පස් ඉවත්කළ ස්ථාන කාර්මික නිලධාරී විසින් පෙන්වාදීමට අපොහොසත් වීම මඟින් අනාවරණය වූයේ ඉටු නොකළ කාර්යයක් වෙනුවෙන් ඉහත මුදල් ගෙවා තිබූ බවයි. | මතුපිට පස් ඉවත්කිරීම භෞතිකව ඉටුකල කාර්යයක් බවත්, භෞතික පරීක්ෂාව සිදුකරන විට අදාල ස්ථානය ලඳු කැළෑ වලින් වැසී තිබුණු හෙයින් නිරීක්ෂණය නොවූ බව. | භෞතිකව ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් ගෙවන ලද මුදල් නැවත අයකරගත යුතුය. |